# චීනයට බුදු දහම ලැබීම පිළිබඳ පවත්නා මතවාද : මූලාශ්‍රය පදනම් කරගත් අධ්‍යයනයක්

*දිල්ශාන් මනෝජ් රාජපක්ෂ* [1]

බුදු දහම මූලික කොට ගත් චීන-භාරත සබඳතා ආරම්භ වූයේ වෙළෙඳාම පදනම් කොටගෙනය. භාරතය හා චීනය අතර සබඳතා වර්ධනය වූයේ ගොඩබිම් මාර්ග හා මුහුදු මාර්ග යන ප්‍රවාහන මාධ්‍ය දෙක හරහාය. මුහුදු මාර්ග මෙන්ම ගොඩබිම මාර්ගද දුෂ්කර විය. භාරතයේ සිට චීනයට පැමිණීමට ප්‍රධාන ගොඩබිම් මාර්ග තුනක් වූ අතර ඒවා නම්, ප්‍රධාන ගොඩබිම් මාර්ගය වූ වයඹදිග ඉන්දියාව, ඇෆ්ගනිස්ථානය, බටහිර තිබ්බතය, රුසියන් තුර්කිස්ථානය, චීන තුර්කිස්ථානය හරහා වූ මාර්ගය, කෙටි වූද, චීනයට භික්ෂූන් වැඩම කළා වූද තොබේරියන් රට පාමිර් සානුව කැෂිසර් හරහා සිකියැං හෙවත් ථාරිම් ස්ථානයෙන් චීනයට යන මාර්ගය හා ඍජු වූද, දුෂ්කර වූද, කශ්මීරයේ සිට ගිල්ගිට් හරහා යාසින්, කෂ්කුර්සානය, කැෂ්සර් සිකියැං හරහා ථාරිං තුළින් චීනයට යන මාර්ගයයි.

චීනයට බුදු දහම හඳුන්වා දීමේ වකවානුව පිළිබඳව උගතුන් අතර එකඟතාවක් නොමැත. කෙසේ වෙතත් ලිඛිතව සපයා ගත හැකි චීන ජනප්‍රවාද තුළින් බුදු දහම පිළිබඳව තොරතුරු විවිධාකාරයෙන් හමු වේ. චීනයට බුදු දහම හඳුන්වාදීම සම්බන්ධව කරුණු ඇතුළත් පුරාකතාවලට අනුව විවිධ පිරිස් ඒ සඳහා දායක වී තිබේ. ඇතැම් විට බෞද්ධ ධර්ම දූතයන් වහන්සේලා මෙන්ම ඇතැම් විට වෙළෙඳුන්, රාජ්‍ය ආක්‍රමණවලට සහභාගී වූ විදේශිකයෝ, සොල්දාදුවෝ, ආක්‍රමණවලින් අසරණව චීනයට පැමිණි අනාථයෝ සහ යුද්ධවලදී පැහැරගෙන ආ සිරකරුවෝ ඒ පිරිස අතර වෙත්. එයට හේතුව වූයේ ඔවුන් සියරටවලදී බුදු දහමේ ආභාසය ලැබ තිබීමය. මෙසේ චීනයට බුදු දහම පැමිණීම පිළිබඳව විවිධ මූලාශ්‍රයවල සඳහන් මතවාද, අධ්‍යයනයේ පහසුව සඳහා කාලපරාස සතරක් ඔස්සේ පහත පරිදි සාකච්ඡා කළ හැකිය. මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ එලෙස චීනයට සම්ප්‍රාප්ත වූ බුදු දහම පිළිබඳව පවත්නා විවිධ මතවාද සාකච්ඡා කිරීමයි. වඩාත් දීර්ඝ ලෙස ගෙනහැර දැක්විය හැකි, මෙහිදී සංක්ෂිප්තව ඉදිරිපත් කෙරෙන එම කාල පරාස සතර නම්;

1. බුදුන්වහන්සේ ජීවමාන සමයේම, චීනයට බුදු දහම ලැබුණ බව සනාථ කෙරෙන සාධක,

2. බුද්ධ පරිනිර්වාණයත්, තෙවන ධර්ම සංගායනාවත් අතර කාලයේ චීනයට බුදු සමය ලැබුණු බව සනාථ කෙරෙන සාධක,
3. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස චීනයට බුදු සමය ලැබුණු බව සනාථ කෙරෙන සාධක,
4. තෙවන ධර්ම සංගායනාවත් ක්‍රි. ව. 1ත් අතර කාලයෙහි චීනයට බුදු සමය ලැබුණු බව සනාථ කෙරෙන සාධක යනාදියයි.

**ප්‍රමුඛ පදඃ-** චීනය, බුදු දහම, බුදුන්වහන්සේ, තෙවන ධර්ම සංගායනාව, ලිඛිත හා පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය

[1]*Ph. D. Candidate, Department of Pāli and Buddhist Studies,University of Kelaniya, Sri Lanka. dilshanmanojrajapaksha@gmail.com*